“ඈ (මරියා) පුත්‍රයකු වදන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබන්න;
මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ
උන්වහන්සේයයි කීවේය”
(මතෙව් 1:21)

# ලෝකාලෝකය

2021 දෙසැම්බර් - 2022 පෙබරවාරි
කලාපය

## ඔබ ස්වකීය යහපත්කම නැමති ඔටුන්නෙන් අවුරුද්ද සරසනසේක; ඔබගේ මාවත්වලින් සාරත්වය වැගිරෙයි
## (ගීතාවලිය 65:11)

# 2022

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# සැබෑ ප්‍රීතිය

ආදර දුවේ පුතේ, ඉතින් අපි දැන් මේ වසරේ අවසානයටම ඇවිත්. කාලය ඉතා වේගයෙන් ගමන් කරනවා. මේ ගෙවී ගිය වසර පුරාවටම අපට බොහෝ අත්දැකීම් වලට මුහුණ දෙන්න සිදුවුණා. මේ සියළු දේ තුලම අප දෙවිපියාණන්වහන්සේ අපට දැක්වූ පුදුමාකාර ප්‍රේමය ගැන අපි උන්වහන්සේට ස්තුතිවන්ත වෙමු. දුවේ, පුතේ වසර අවසාන මාසය වන විට පුංචි ඔයාලා හැමෝම කැමති මාතෘකාවක් ගැන මුළු ලෝකයම කතා වෙනවා ඒ වගේම ඒ සඳහා සූදානම් වෙනවා. ඔව් දුවේ, පුතේ ඒ තමයි නත්තල. නත්තල යන වචනය ඇසු සැණෙන් ඔබට මතක් වෙන්නේ මොනවාද? අලංකාර සැරසිලි, විදුලි අලෝකයන්, විවිධ ඇඳුම් විලාසිතා, කෑම වර්ග, තෑගිබෝග, උත්සව..... මෙවැනි තවත් බොහෝ දේවල් නේද? ඔව්... සැබවින්ම නත්තල යන වචනයේ ඇත්තේ ප්‍රීතියයි.

ඔබ දන්නවද නත්තල යනුවෙන් මුළු ලෝකයම උත්සවශ්‍රීයෙන් සමරන්නේ යේසුස්වහන්සේගේ උත්පත්තිය. බෙත්ලෙහෙමේදී උපත ලැබූ යේසුස්වහන්සේ හැදී වැඩෙන්නේ නාසරෙත් නුවරයි. උන්වහන්සේ වයස අවුරුදු 30 පමණ වනවිට උන්වහන්සේ මේ පොළොවට පැමිණීමේ අරමුණ වෙනුවෙන් ක්‍රියා කිරීමට පටන් ගත්තා. මොකක්ද උන්වහන්සේගේ සැබෑ අරමුණ? දුවේ පුතේ උන්වහන්සේ මේ පොළවට පැමිණීමේ සැබෑ අරමුණ නම් ඔබත් මමත් පාපයෙන් ගලවා ගැනීමයි. පව්කාරයන්ට හිමි දඬුවම් ගෙවා අපව ගලවා ගැනීමයි. **"පව්කාරයන් ගලවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආසේක"** යන කීම විශ්වාසවූ සර්වප්‍රකාරයෙන්ම පිළිගත යුතු වූ කීමක්ය. **1 තිමෝති 1:15** යේසුස්වහන්සේට සැබවින්ම අවශ්‍ය වන්නේ අප සියළු දෙනාම උන්වහන්සේ අදහා විශ්වාසකර සදාකාල ජීවිතය ලබා ගැනීමයි.

දුවේ, පුතේ ස්වභාවයෙන්ම පව්කාරයන්ව සිටින අපට අපේ පාපයට හිමි දඬුවම් නම් මරණයයි. යේසුස්වහන්සේ මේ පොළවට ඇවිත් අපිට ලැබිය යුතු දඬුවම් අප වෙනුවෙන් ගෙවා දැමුවා. ඒ කුරුසියක් මත උන්වහන්සේගේ ජීවිතය පුදකිරීමෙන් **(යොහාන් 12:24-27)** පසුව උන්වහන්සේ දින 3 කින් මරණයෙන් නැගිට දැන් ස්වර්ගයේ වැඩවාසය කරන සේක. ඉතින් දුවේ, පුතේ යේසුස්වහන්සේට සැබවින්ම අවශ්‍යයවන්නේ අපි අපේ සියළු වැරදි හා පාප වලට උන්වහන්සේගේ රුධිරය කරණකොට ගෙන සේදී පවිත්‍රව උන්වහන්සේ ඔබගේ ගැලවුම්කාරයාණන් ලෙස අදහා ගැනීමයි. ඒවිට අපිට උන්වහන්සේගේ දරුවෙකු වීමට පුළුවන්.

දුවේ පුතේ නත්තල් කාලයේ ඔබ දකිනවාසේ යේසුස්වහන්සේ ගව මඩුවක තබා ඇති බිළිඳෙක් නොවෙයි. උන්වහන්සේ ඔබගේත් මගේත් ගැලවුම්කාරයාණන් වහන්සේය. ස්වර්ගයේ වැඩවාසය කරන ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයායි. ඉතින් මේ නත්තලේ උන්වහන්සේව සැමරිය හැකි හොඳම ක්‍රමය ඔබ ඔබගේ පාප වලට උන්වහන්සේගෙන් සමාව ලැබ උන්වහන්සේගේ දරුවකු වීමයි. සියල්ලටම ඉහළින් එය නත්තලේ සැබෑ ප්‍රීති යයි.

ඔබට ප්‍රීතිමත් නත්තලක් සහ සුභ නව වසරක් වේවා!

යේසු පිහිටයි

ආදර

**- ශෂිලා නැන්දා -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත දී කියූ ප්‍රකාශ හත.

මනුෂ්‍යයාගේ පාපයේ දඬුවම ගෙවීමට ස්වර්ගයේ සිට මහ පොළවට පැමිණි දිව්‍ය මිනිසා වන යේසුස්වහන්සේ පාපයේ වන්දි මිලය ගෙවීම උදෙසා තම ජීවිතය ස්වකැමැත්තෙන්ම පූජා කළේය. එවකට තිබූ කෲරතර මරණ දඬුවම වන කුරුසියක් මත තබා ඇණ ගැසීමට ඉඩ දීමෙනි. එම අවස්ථාවේදී එනම් වේදනාවෙන් කුරුසිය මත එල්ලී සිටියදී උන්වහන්සේ කියු දේ බයිබලයේ ලියා තිබේ. එම ප්‍රකාශ දෙස අපි බලමු.

## 01 සමාවදීම

**"පියාණෙනි, <u>ඔවුන්ට කමාවුව මැනව;</u> මක්නිසාද ඔවුන් කරන්නේ මොකක්ද කියා ඔවුන් නොදනියි. යේසුස්වහන්සේ කී සේක" (ලුක් 23:34).**

තමන්ව ලී කුරුසියක් මත තබා යකඩ ඇණ ගහන ඒ නපුරු සොල්දාදුවන්ට සමාව දීමට උන්වහන්සේට හැකි විය. එය උන්වහන්සේ කලේ මුළු හදවතින්මයි. එනම් සමාව දීම යනු දිව්‍යමය ස්වර්ගික වූ දෙයකි, හැඟීමකි, යේසුස්වහන්සේගේ ඉගැන්වීමේ ප්‍රධාන කාරණයක් වන්නේ සමාව දීමයි. මක්නිසාද උන්වහන්සේ ස්වර්ගයේ සිට පොළවට පැමිණියේ පව්කාරයන්ට සමාව දී දේව දරුවන් බවට පත් කිරීමටයි. අපට වැරදි කරන අයට සමාව දීම සෑම කිතුනුවකුගේම කැඳවීමයි. දෙවියන්වහන්සේගේ කැමැත්තයි. අපට වැරදි කරන අයට සමාව දුන්විට එහි ප්‍රයෝජනය හා වාසිය ලැබෙන්නේ අපටමයි. එය ඇතුලාන්ත ආත්මිකවූ ප්‍රීතිමත්භාවයයි.

## 02 ගැලවීම (ස්වර්ගය)

**"සැබවක් නුඹට කියමි. <u>අද්දම නුඹ මා සමග පාරාදීසයෙහි (ස්වර්ගයේ) සිටින්නෙහියයි</u> යේසුස්වහන්සේ කීසේක" (ලූක් 23:43).**


මෙම වචන යේසුස්වහන්සේ කීවේ තම දකුණු පැත්තේ ඇණ ගසා සිටි සොරාටය. ඔහු තම වැරදි ගැන පසුතැවිලි වන්නට ඇත. ඉන් පසු යේසුස්වහන්සේගෙන් ඔහු ඉල්ලා සිටියේ දේව රාජයට ඔහු ඇතුල් කර ගන්න ලෙසයි. එය එසේම සිදු වුවා නිසැකයි.

ස්වර්ගයට යෑමට මනුෂ්‍යකුට අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රසාදය

නොහොත් අනුග්‍රහය පමණි. (**ඒපීස 2:8**) මෙම සොරා සභාවකට ගියේද නැත. බෞතීස්ම වුයේද නැත. කිතුණු නීති රීති, චාරිත්‍ර අනුගමනය කළේද නැත. එහෙත් ඔහු දේව රාජ්‍යයට ඇතුල්විය. ඒ සඳහා අවශ්‍ය වන්නේ තම පව් ගැන පසුතැවිලි වී යේසුස්වහන්සේ අදහා ගැනීම පමණි (**ක්‍රියා 16:31**).

## 03. සාක්ෂිය
## (වගකීම්සහිතභාවය / දෙමව්පියන්ට සැලකීම).

**"එකල යේසුස්වහන්සේ තමන්ගේ මෑණියන්ද ළඟ සිටියාවු තමන් විසින් ප්‍රේමකලාවු ගෝලයාද දැක ස්ත්‍රීය, මෙන්න නුඹේ පුත්‍රයා! යයි. තමන් මෑණියන්ට කීසේක" (යොහාන් 19:26).**



මේ වන විටත් දැඩි වේදනාවකින් හා ගාවිනාවකින් කුරුසියේ එල්ලී සිටි යේසුස්වහන්සේ තම මෑණියන් අඬමින් කුරුසිය පාමුල සිටිනවා දුටුසේක. ඇගේ වගකීම යොහාන්ට භාර කිරීමට යේසුස්වහන්සේ අමතක නොකල සේක. මෙයින් උන්වහන්සේ අපට පෙන්වා දෙන්නේ වගකීම සහිත කිතුණුවකු වීමයි. දෙමව්පියන්ට සැලකීම වැනි හා එවැනි වගකීම හා යුතුකම් මග හැර ජීවත්වීම තුලින් කිතුණු සාක්ෂිය හානි වී දෙවියන්වහන්සේගේ නාමය අගෞරවයට පත් වේ. කිතුණුවකු ලෙස ජීවිත සාක්ෂියක් ඇතුව ජීවත් වීමෙන් අප තුලින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් වේ.

## 04. විනිශ්චය
## (පාපයේ ප්‍රතිඵලය)

**"මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත් හැරියේ මක්නිසාද කියා මහත් ශබ්දයකින් යේසුස්වහන්සේ මොරගැසු සේක" (මතෙව් 27:46,41)**

මෙහිදී සිදු වුයේ මනුෂ්‍යය සංහතියේම පාපය යේසුස්වහන්සේගේ ශරීරය මතට වැටී තිබීමයි. එහි ප්‍රතිඵලය ලෙස දෙවියන්වහන්සේ සමග තිබුණු සම්බන්ධතාවය මොහොතකට බිඳී ගියේය. ශුද්ධ වු දෙවියන්වහන්සේට පාපය සමග සම්බන්ධතාවයක් පවත්වාගෙන යා නොහැකිය. මෙහි අපට ඇති පණිවුඩය නම් පාපය විසින් ඕනෑම කෙනෙකු දෙවියන්වහන්සේගෙන් වෙන්කරයි. අපගේ ජීවිතයටත් මෙම සිද්ධාන්තය බලපාන්නේ කෙසේද? අප දිගින් දිගටම පව්කරන විට දෙවියන්වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය කැඩී බිඳී යයි.

## 05. දුක්විඳීම
## (ශාරීරික දුක් විඳීම)

**"උන්වහන්සේ මට පිපාසයි කී සේක" (යොහාන් 19:28).**

මනුෂ්‍යයාගේ පාපයේ වන්දිය

ගෙවීම උදෙසා යේසුස්වහන්සේ තම ශරීරයෙන් දුක් වින්දසේක. කසපහර, කම්මුල්පහර, ඇණපහර, කටු ඔටුන්න, හෙල්ලයෙන් ඇනීම වැනි ශාරීරික වද හිංසා හා ඇතුලාන්තයෙන් මහත් ගාවිනාවක්, වේදනාවන්, විදීමට උන්වහන්සේට සිදුවිය. අවසානයේදී උන්වහන්සේගේ ශරීරයෙන් රුධිරය අන්තිම බිංදුව දක්වාම ගලා ගියේය. ඒවිට උන්වහන්සේට පිපාස විය. යේසුස්වහන්සේ ශරීරාකාරයෙන් මහත් දුකක් වේදනාවක් විඳ අපව පාපයෙන් නිදහස් කලසේක. එය සිහිකිරීම අපගේ වගකීමකි. යුතුකමකි (1 කොරින්ති 11:23-30).

## 06. ජයග්‍රහණය

## (පාපයේ වන්දී ගෙවීමේ ක්‍රියාවලිය අවසන් කිරීම)

**"යේසුස්වහන්සේ කාඩි ගත් පසු <u>තීන්දුවුණේය</u> කියා හිස නමා තමන් ආත්මය භාරදුන්නේය" (යොහාන් 19:30).**

මෙය පව්කාර මනුෂ්‍යාට ගෙන දුන් විශාලතම ජයග්‍රහණයයි. පව්කාරයන්ට ස්වර්ග රාජ්‍යයට ඇතුල් වීමට දොරටුව ඇරුණේ මේ අවස්ථාවේදිය. මුළු මනුෂ්‍ය සංහතියේම පාපයේ වන්දිය ගෙවා නිම කරන ලදී. අප එකිනෙකාගේ ද පාපයේ දඬුවම් උන්වහන්සේ ගෙවා දමා ඇත. මෙය විශ්වාස කිරීම හෝ නොකිරීම මනුෂයාගේ වගකීමකි.

## 07. ප්‍රීතිය -

## (දෙවියන්වහන්සේට භාරවීම)

**"යේසුස්වහන්සේ මගත් ශබ්දයකින් මොරගසා පියාණෙනි, ඔබගේ අතට <u>මාගේ ආත්මය භාරදෙමියි</u> කීසේක" (ලූක් 23:46).**

යේසුස්වහන්සේ තම ආත්මය ස්වර්ගික පියාණන්වහන්සේට භාර දී යාච්ඤා කිරීම මෙහෙදී දක්නට ලැබේ. ඕනෑම අමාරු ජීවිත අත්දැකීම් තුලින් අප යන විට කළ හැකි හොඳම එකම දෙය නම් යාච්ඤාවෙන් එම කාරණය දෙවියන්වහන්සේට භාර දීමයි. එවිට උන්වහන්සේ අපට හොඳම පිලිතුර හෝ විසඳුම් ගෙන දෙයි. අපගේ ආත්මයටද හොඳම ස්ථානය වන්නේ දෙවියන්වහන්සේය.



උන්වහන්සේ තුළ කිසිම නපුරක් නැත. ඔබත් මමත් අපගේ ජීවිත දෙවියන්වහන්සේට යටත් කර භාර දෙමු. එවිට උන්වහන්සේ අපගේ ප්‍රීතිය හා සතුට වැඩි කරන සේක.

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**




# ඊශ්‍රායෙල්වරුන්ගේ පළමු රජ

බයිබලයේ එන රජවරු පිලිබඳ ලිපියෙන් අප අද හමුවන්නේ. ඊශ්‍රායල්වරුන්ගේ ප්‍රථම රජු ලෙස පත්වු කීෂ්ගේ පුත්‍රවු සාවුල්ය. පාරාවෝගේ වහල් බැම්මෙහි පුරා වසර හාරසිය තිහක් හිරවී සිට මොසෙස් කරණකොටගෙන එයින් නිදහස්ව පොරොන්දු දේශයට (ඊශ්‍රායෙලයට) පැමිණියා වූ දේව ජනතාව එතැන් පටන් පාලනය කරනු ලැබුවේ විනිශ්චකාරයන් විසිනුයි. විනිශ්වයකරුවන් වශයෙන් යොෂුවාගේ සිට සාමුවෙල් ද ඔහුගේ පුත්‍රයන්වු යෝවෙල් හා අබියාද දක්වා ක්‍රියා කලහ. සම්සොන්, ගිඩියොන් බාරාක්, යෙප්තා ෂම්ගර් වැනි විනිශ්වයකරුවෝ කීර්තිමත් අයවලුන් වුහ, එහෙත් සාමුවෙල්ගේ පුත්‍රයෝ දෙදෙනාගේ පක්‍ෂවාදී විනිශ්චයන් නිසා ඔව්හු යුක්තිය පසිඳලීමේදී ඊශ්‍රායෙල් ජනතාවගේ පිළිකුලට පාත්‍රවුහ, (**1 සාමුවෙල් 8:1-6**) මේ වනතුරු රජකෙනෙකුගේ පාලන රටාව ඊශ්‍රායල්වරුන්ට අහිමිවූ නමුත් ඔව්හු රජකෙනකු ඉල්ලා සාමුවෙල්ට කරදර කලහ. මෙහි ප්‍රතිඵලය වුයේ දෙවියන්වහන්සේ විසින් කීෂ්ගේ පුත්‍රවූ සාවුල් නම් ධනවත් ශෝභමාන තරුණයා



රජකමට පත්කිරීමය. (**1 සාමුවෙල් 9:1 සිට 10:27 දක්වා**) මේ බැව් සඳහන්වේ. සාවුල් පිට තෙල් ආලේපකොට ඔහු රජකමට පත්කලේ සාමුවෙල් විසින්ය. (**1සාමුවෙල් 10:6** දැක්වෙන පරිදි සාවුල් දේවාත්මයෙන් පූර්ණව ධර්මවාක්‍යයද පැවසු බව අප දනිමු). සාවුල් රජවුයේ ඔහුව යාන්තම් තිස්විය එළඹෙන විටදිය. (**1 සාමුවෙල් 13:1**)

## <u>හිතුවක්කාර කමක්</u>

සාවුල් ඉතා බලසම්පන්නවුත් එඩිතරවුත් රජෙකි. එසේම අම්මොන්වරුන් පිලිස්තිවරුන් ආදී සතුරු සේනාවන් පහසුවෙන් දිග්විජයකල රණශූරයෙකි. එහෙත් සාවුල්ගේ රජකම ස්වාමීන් වහන්සේගේ හස්තයෙහි ස්ථිරවුයේ නැත. ඔහුගේ හදිසි කෝපය හා ඉක්මන්කම මෙන්ම වස්තු තෘෂ්ණාවද සාවුල් රජුගේ අනාගත අභිවෘද්ධිය

විනාශකර දැම්මේය. ඔහු වරක් ගිල්ගාල් නම් ස්ථානයේ සිටියේදී දවන පූජාවක් පැවැත්වීමේ අටියෙන් පූජකවූ සාමුවෙල් එනතුරු බලා සිටියේය. එහෙත් සාමුවෙල්ගේ පැමිණීම පමාවනු දුටු ඔහුගේ කෝපය හා ඉක්මන්කාර ස්වභාවය නිසාම තමා විසින්ම දවන පූජාව ඔප්පුකරමින් පූජකයාගේ මෙහෙය තමාගේ අතට ගත්තේය. ඔහු රජෙක් මිස පූජකයෙක් නොවිය. පූජාව පුදා නිමවූ තැන සාමුවෙල් පැමිණියේය. සාවුල් පෙරමගට ගොස් ඔහුට ආචාර කළේය. එහෙත් සාමුවෙල්ගේ වචන මෙසේවිය, " **නුඹ අනුවන ලෙස ක්‍රියා කළෙහිය. නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ නුඹට අණකල උන්වහන්සේගේ ආඥාව නුඹ රක්ෂාකළේ නැත. රක්ෂාකලානම් ස්වාමින්වහන්සේ නුඹේ රජකම ස්ථිර කරනවා ඇත. නමුත් දැන් නුඹේ රජකම පවතින්නේ නැත. ස්වාමින්වහන්සේ නුඹට අණකළදේ නුඹ රක්ෂා නොකළ බැවින් උන්වහන්සේ තමාගේ සිතට එකඟවූ මනුෂ්‍යයෙකු සොයාගෙන තමන්ගේ සෙනග කෙරෙහි අධිපතියා වෙන්ට ඔහු නියමකර තිබේ" (ක්‍රියා 13:22 බලන්න).** මෙහිදී අප විසින්ද සිහිතබාගත යුතු ආත්මික ප්‍රතිපත්තිය වන්නේ දෙවියන්වහන්සේගේ සිතට එකඟවූ අයවලුන් මිස ප්‍රසිද්ධිය හෝ ධනවත්කම හෝ උගත්කම ඇත්තාවූ අයවලුන් දෙවියන්වහන්සේ උසස් නොකරණ බවය. දේවසේවයට ඇත්තාවූ මූලික සුදුසුකම් වන්නේද යටහත්වීමෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරමින් උන්වහන්සේගේ සිතට එකඟව සිටීමය. සාවුල් මීට අපොහොසත් විය. පිලිස්තිවරුන් ඔහු සමග නිරන්තර සටනට එළඹගත්හ. ඇතැම් අවස්ථාවලදී සාවුල් තමාගේ කීර්තිමත් පුත්‍රයාවූ යොනාතන් නිසා ජයගත් නමුත් සටන් නිමවූයේ නැත. දෙවියන්වහන්සේ මේ වනවිට රජකම සඳහා වෙනත් දුප්පත් තරුණයෙක් තොරාගෙන සිටි බැවින් සාවුල් කෙරෙහි උන්වහන්සේගේ අනුග්‍රහයක් නොවූ අතරම සාවුල් ද තමාගේ වරද ගැන පසුතැවිලිවීමට " යටත්වූයේ" නැත. ඇතැම්විට ඔහු තම වරද කියාදී දේවකමාව ඉල්ලුවේනම් තත්වය මීට වෙනස් වන්නට ඉඩ තිබිණි. කෙසේ වෙතත් සාවුල් තවත් බලවත් වරදක් කරමින් දෙවියන්වහන්සේට විරුද්ධව පව්කලෙන් ඔහුගේ එපාකරනු ලැබීම ස්ථිරවිය. එය සිදුවූයේ මෙසේය. (**1 සාමුවෙල් 13:8 - 23 දක්වාද 15:1 - 35** දක්වාද ඔබට කියවා බැලීම වටින්නේය).

## රජකම පහවෙයි !

ස්වාමින්වහන්සේ සාවුල් වෙත පණිවුඩයක් යැවූසේක. පණිවිඩකරුවා සාමුවෙල්ය. පනිවුඩයේ අමලෙක්වරුන්ට විරුද්ධව සටන්කොට ඔවුන් මුළුමණින් විනාශකරදමා ඔවුන් සතු සියල්ල නාස්තිකර දමන ලෙසය. ගවයන්

කොටළුවන් බැටළුවන් ආදී කිසිවක්ම ඉතිරිකර නොගනන්නා ලෙසද ස්වාමින්වහන්සේ අණකලසේක. සාවුල් අමලෙක්වරුන්ගේ නුවරට පැමිණ සැඟවී සිටියේ. දෙලක්‍ෂ දසදහසක්වු පාබල හමුදාව හා යුද සෙනග සමග සාවුල් හවිලා දේශයේ සිට ෂුර් දේශය දක්වා බලවත් පහරදීමකින් අමලෙක්වරුන් විනාශ කර දැමිය. අමලෙක් රජු වු ආගග් ජීවග්‍රහයෙන් අල්ලාගත් සාවුල් ඉතා පෝෂණය වු ගවයන් හා බැටළුවන් ඉතිරිකරගෙන නුසුදුසු නොවටිනා සියළු සත්වයන් විනාශ කර දැමුවේය. **(1 සාමුවෙල් 15:9)** මෙහිදී ස්වාමින්වහන්සේගේ නියෝගය මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමට සාවුල් අපොහොසත් වුයේ තරවු ගවයන් හා බැටළුවන් කෙරෙහි (භූමික වස්තුන් කෙරෙහි) තිබු ආශාවය මේ නිසා ස්වාමින්වහන්සේ දෙවනවර ඔහු එපාකළසේක. ඔබත් මමත් දේව නියෝගය දෙවැනිකොට මිනිස් සිතේ ආශාවට මුල්තැන දෙන විටත් සිදුවන්නේ දේව කරුණාව අහිමිවීමයි. **"සාවුල් මගේ වචනය ඉෂ්ධ නොකර මා අනුව යාමෙන් අහක්ව ගියේයයි ස්වාමින්වහන්සේ කීසේක" (1 සාමුවෙල් 15:11).**

සාමුවෙල් මේ පිළිබඳව ප්‍රශ්ණ කල විට සාවුල්ගේ උත්තරය වුයේ කුමක්ද? **"නුඹ සියල්ල විනාශ කළේනම් මගේ කන්වලට ඇසෙන බැටළුවන් හා ගවයන්ගේ හඬක් කුමක්ද?"** ප්‍රශ්ණය එයයි. පිළිතුරු මෙයයි. **"මම ස්වාමින්වහන්සේගේ හඬට කීකරුව, ස්වාමින්වහන්සේ මා යැවු ගමන ගොස් අමලෙක්වරුන්ගේ රජවු ආගග් ගෙනාවෙමි, අමලෙක්වරුන්ද සාමුලින්ම විනාශකර දැම්මි. නමුත් සෙනග වනාහි විනාශයට කැපවු දේවලින් ප්‍රධාන නොවන බැටළුවන්ද ගවයන්ද කොල්ලය අතරෙන් රැගෙන ගිල්ගාල්හීදී ඔබගේ දෙවිවු ස්වාමින්වහන්සේට පූජා කරණ පිණිස ආවෝය".** සාමුවෙල් යලිත් දෙන අවවාදය අදත් අප සැමට යෝග්‍යය. ස්වාමින්වහන්සේගේ හඬට කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග පූජාවලටත් ප්‍රසන්නවන සේක්ද? පූජාවට වඩා කීකරුවීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන්දීමත් හොඳය. මක්නිසාද කැරලි කාරකම පේන කීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමේ පාපයටත් සමානය. **" නුඹ ස්වාමින්වහන්සේගේ වචනය පහකළ නිසා ස්වාමින්වහන්සේ නුඹෙන් රජකම පහකළසේකැයි කීවේය" (1 සාමුවෙල් 15:22).**

## සාවුල්ගේ වැටීම

සාවුල්ගේ මුළු ජීවිත කාලයේදී ඔහුට විරුද්ධව යුද්ධ අඩු වූයේ නැත. **1 සාමුවෙල් 15:35** හී දැක්වේ. පිලිස්තිවරුන්ගේ යෝධයෙක්වු ගාත්හි ගෝලියත් තම ඊශ්‍රායල් ජනතාවට මිග (බැන වදිමින්)

කියමින් ඔවුන්ට සරදම් කරන්නට විය. මේ කාලයේදී සාවුල්ගේ අපකීර්තිය වැඩිවිය. ඔහු හෝ ඔහුගේ පළපුරුදු සේනාංක ගොලියත් පරදවන්නට සමත් නොවුයෙන් පසුව දාවිත් විසින් ඔහුව පරදවාලු අයුරුත් මීළඟ ලිපියෙහි කියවමු. ගොලියත් ජයගත් සාවුල් විසින් දාවිත්ට සිය පොරොන්දු ඉටුකළේද නැත. දාවිත් මරන්නට සෙවු ඔහුව, දාවිත් විසින් දෙවරක්ම මරණයෙන් ගලවා ගැනීමෙන්ම දාවිත්ගේ යහපත් බව කදිමට සනාථවෙයි. එහෙත් සාවුල්ගේ පුත්‍රවු යොනාතන් දාවිත්ගේ හිතේශී මිත්‍රයා විය. සාවුල් විසින් දාවිත් මරන්නට සෙවු සෑම විටකම දාවිත් ගැළවුයේ දෙවියන්වහන්සේ ඔහු සමග වූ නිසාමය. සාවුල්ගේම වචනයෙන් ඔහු දරණ සාක්ෂියක් මෙසේය. " **දෙවියන්වහන්සේ මා කෙරෙන් අහක්ව ගියසේක" (1 සාමුවෙල් 28:15).**

## සාවුල්ගේ මරණය

සාවුල් විසින් කරනු ලැබු තවත් භයාණක පාපයක් විය. ඔහු එන්දෝර් නම් ස්ථානයට වෙස්වලාගෙන ගොස් ආත්මබන්ධනකාර කතකගෙන් අංජනමක් බැලුවේය. ඔහු ආත්මබන්ධනකාරයන් හා අනවිනකාරයන්ද දේශයෙන් පහකර තිබු නමුත් පසුව එම දුර්වලකමට වැටුණෝය. **ලෙවි කතාව 20:27** අනුව දේව ජනතාව අංජනම් නිමිති සාස්ත්‍ර, මන්ත්‍ර හදි හුනියම් සහමුලින්ම ප්‍රතික්ෂේප කරති. කිතුණුවන්වු සියලු එපීසවරුද තමන් පාවිච්චිකළ ගුරුකම් පොත් පුලුස්සා විනාශ කර දැමු අයුරුත් ඒවායේ වටිනාකම් රිදී මිල 50,000 ක් බවත් **ක්‍රියා 19:19** දැක්වේ. සාවුල් පිළිබඳව බොහෝ දේ කතාකල හැකිවුවද ඔහුගේ



මරණය සිදුවු ආකාරය දැක්වීමෙන් මෙම ලිපිය නිම වෙයි. ගිල්බෝවාහිදී පිලිස්තිවරුන්ගේ දැඩි ප්‍රහාරයට ලක්වු ඊශ්‍රායල්වරු කන්දේදී මැරී වැටුණෝය. සාවුල්ගේ පුත්‍රයන් වු යොනතාන්, අබිනාදාබ් හා මලිකි-ෂුවාද මරණු ලැබිය. සාවුල් තමාගේම කඩුව සිටුවා ඒපිට වැටී **(1 සාමුවෙල් 31)** දඟලමින් සිටින අතර අමලෙක් මනුෂ්‍යයෙක් ඔහු මැරුවේය. **(සාමුවෙල් 1:9-10)** සාවුල් හතලිස් වසරක් ඊශ්‍රායල්ගේ රජු ලෙස සිටියේය.

**- ප්‍රන්සිස් විජේසිංහ -**

# සැබෑ ජීවිත විපර්යාසයක් අත්දැක්කෙමි.

මොරටුව ප්‍රදේශයේ ධීවර පවුලක බාලයා ලෙස ඉපදුන මගේ පවුලේ සහෝදර සහෝදරියන් නව දෙනෙකි. නමුත් මා හැදී වැඩුනේ වැඩිමහල් පිරිමි සහෝදරයන් පස් දෙනා සමගිනි. අනෙක් සහෝදරියන් දෙදෙනා සහ මගේ නිවුන් සහෝදරියට පවුලෙන් වෙන්වීමට සිදුවුණේ ධීවරයෙක් වූ මගේ පියාට දරුවන් නව දෙනෙකුගේ බර දැරීමට නොහැකි වූ නිසාය. ඉතා කුඩා කලම අප මෙසේ වෙන්වී ඇති අතර ඔවුන් ගැන මට මතකයක් නැති තරම්ය. අයියලා පස්දෙනාටත් මටත් අපේ කුඩා කාලය ලෙහෙසි වුයේ නැත. දරිද්‍රතාවයේ පතුලටම කඩා වැටුණු අපේ පවුල මොරටුව වැල්ලේ ජීවත් වූ ඉතාම දිළිඳු පවුල් වලින් එකකි.

කාලය මෙසේ ගතවෙන්ම මට යන්තම් වයස අවුරුදු 7ක් පමණ වන විට මගේ පියා ජීවිතක්ෂයට පත්විය. මගේ මව කෙතරම් අසරණ වුවාදැයි මතක් වනවිට අදටත් මගේ නෙතින් කඳුළු ගලා යයි. මගේ සහෝදරයන් පස්දෙනාම ඉතාම කුඩා වයසෙන් මත්ද්‍රව්‍ය, මත්වතුර, හොර මැරකම් ආදී සියළු පාපයන් හි ගිලුණේ මගේ මවගේ බලාපොරොත්තු සියල්ල නැති කරමිණි. ඔවුන් අප ජීවත් වූ නිවස පවා විකුණා තිබු අතර මමත් අම්මාත් අවසානයේ නතර වුණේ මහපාරේය. මගේ මව මා නැන්දාගේ ගෙදර නතර කර පසුව ගුරුවරියකගේ නිවසක නතර වී අධ්‍යාපනය ලබන්නට ඉඩකඩ සලසා දුන්නේය. නමුත් මා පාසල් ගිය විට පැමිණෙන වැඩිමහල් සහෝදරයාගේ බිරිඳ විදුහල්පතිතුමා ඉදිරියේ බොහෝ මුසා පවසා මාව පාසලෙන් රැගෙන ගොස් ඇගේ නිවසේ වැඩ කරවාගත්තේය. මෙසේ කඩින්කඩ ගිය පාසල් ගමන පහ ශ්‍රේණියෙන්ම නවතා දමන්නට මට සිදුවිය. නමුත් මගේ මව කෙසේ හෝ මා ඉහත කී ගුරුතුමියගේම නිවසේ නවතා තබන්නට කටයුතු කළ අතර ඇගේ නිවසේ වැඩකටයුතු වලට උදව් කරමින් මට වයස අවුරුදු 17ක් පමණ වනතුරු සිටිනන්ට හැකිවිය.

ඉන්පසු තරුණියක ලෙස නැවතත් මා මගේ නැන්දාගේ නිවසට පැමිණ එහි වාසය කලාය. මේ වන විට මගේ සහෝදරයන්ගේ තත්වය ඉතා ශෝචනියව තිබුණි. ඔවුන් මහ අපරාධ ජීවිත ගත කලහ. මත්ද්‍රව්‍ය වෙළඳාම, හොර මැරකම්, මංකොල්ලකෑම් ආදියෙහි ඔවුන්ට වඩා ජගතුන් වෙනත් නැති තරම්ය. ඒ හා සබැඳි ප්‍රශ්ණ කරදර ඉහටත් උඩින් පැමිණි අතර මටත් මවටත් අපේ ජීවිත ගැන මහ කළකිරීමක් විය. මේ කාලය වන විට මට තරුණයෙකු මුණ ගැසුණු අතර මගේ පවුල් පසුබිම තුල මා දකින දේ වලට වඩා වෙනස් ගතිගුණ ඔහු තුල තිබු අතර ඔහුගෙන් මා ලැබූ සැනසීම මහත්ය. මේ කාලයේදී මා විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගිය අතර, නැවත මා මව්බිමට පැමිණ රත්මලාන වෙරළබඩ ප්‍රදේශයේන් ඉඩමක් මිලදී ගෙන ඔහු සමග එහි සාදාගත් කුඩා නිවසක පදිංචි වුණා. අපේ විවාහය අපගේ කැමැත්තට සිදුවූ අතර දෙපාර්ශවයේම පවුල්වල ආශිර්වාදය අපට නොලැබුණි. නමුත් අගහිගකම් අපට තදින් දැනෙන්ට වූ නිසා මම මගේ වැඩිමහල් පුතාට වයස අවු 1 1/2 පමණ වන විට නැවත විදේශගත විය.

එහිදී දෙවියන්වහන්සේ මට බොහෝ පාඩම් කියා දුන් අතර රූප වන්දනාව පිළිබඳ බොහෝ සත්‍යයන් මා තේරුම්ගත්තා.

වෙරලබඩ ධීවර පවුල් වල ඉපදුන අප ඉතාමත් තද රූප පිළිම වන්දනාකරුවන් වු අතර, ඒ තුළ වූ නිශ්පලභාවය මා තේරුම් ගත්තා. රූප වන්දනාව අත්හරින්න යැයි මා මගේ සැමියාටද ලිපි යොමු කළ බව මට මතකයි. මා විදේශ ගතවීමට පෙර එක් සහෝදරියක් මං මාවත් වල ඇවිදයමින් ශුභාරංචිය ප්‍රකාශ කළා. මටද ඇය හමුවු අතර මා ඇය සමග බොහෝ තර්ක කරන්නට වුණා. එයින් නොසැලුනු ඇය මා ජීවත් වූ නිවසට පැමිණ මුහුදු වැල්ලේ දණගසා මා වෙනුවෙන් යාච්ඥා කලා. ඒ ගැන යම් පැහැදීමක් මා තුල නොවුනත් ඒ මොහොතෙහි දෙවියන්වහන්සේ මා තුල ක්‍රියා කරන බව මට තේරුම් ගියා. ඉන්පසු විදේශයක තනි වු මා තුල උන්වහන්සේ ක්‍රියාකරන්නට පටන් ගත්තා. විදේශයේදී පවා බොහෝ අනතුරුවලින්ද උන්වහන්සේ මා බේරා ගත්සේක.

නැවත මව්රට පැමිණ මා දෙවන වරටද පිරිමි දරුවෙකුගේ මවක් බවට පත්විය. මේ කාලයේදී විදේශ රටේදී (මැදපෙරදිග) ඔවුන්ගේ ආගම පුහුණු කිරීමට මා පටන්ගත්තා. නමුත් ඒ කාලයේදී පවා මා දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියේ මට සත්‍යය සොයා ගැනීමට අවශ්‍යය බවය. මැදපෙරදිග සිට පැමිණි මා මගේ නිවසෙහි වු සියළු රූප, පිළිම පහන් විසිකර දැමු අතර ගෙදර හවසට පහනක් නොතැබීම ගැන අසල්වැසියන්ගේ දෝශාරෝපණයට ලක් විය.

නමුත් මේ කිසිදු ක්‍රියාවක සැබෑ දෙවියන්වහන්සේ මට හමු නොවිය. මේ අතර දිනක මාගේ සහෝදරයාගේ වැඩිමහල් සොහොයුරා අප නිවසට පැමිණි ඔහු නමස්කාර කරන සභාවට පැමිණෙක ලෙස මට ආරාධනා කළා. ඒ අනුව අපි වැල්ලවත්තේ ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානයට පැමිණි අතර ඇදහිලිවන්තයන්ගේ සහභාගිකමට මම ඉතා ආශා වුනෙමි. එහිදී මා සැබෑ සුභාරංචිය ඇසු අතර, මා මහා පව්කාරියක් බව තේරුම්ගත්තෙමි. මගේ පව් වලට ඇති එකම පිළියම ස්වාමි වු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් සේදීමෙන්. උන්වහන්සේගේ පාප කමාව ලැබීමයි. මා මගේ මුළු හදවතින්ම යේසුස්වහන්සේ පිළිගත් අතර මගේ ජීවිතයේ ස්වාමියා බවට උන්වහන්සේ පත්විය.

කාලය ගතවීමත් සමග මගේ ස්වාමිපුරුෂයාද ගැලවීම ලැබු අතර අපේ ජීවිත ප්‍රීතිමත් වන්නට විය. ඒ අප ක්ෂනිකයෙන් පොහොසත් වීමෙන් නොව අප සමග ස්වාමිවු යේසුස්වහනන්සේ සිටි නිසාය. දරුවන් තිදෙනා උස්මහත් කිරීමට මටත්, සැමියාටත් බොහෝ වෙහෙස වන්නට සිදුවිය. නමුත් අපි පුදුමාකාර සමගියෙන් හා ප්‍රීතියෙන් එසේ කළෙමු. ජීවිතයේ මුහුණදුන් අනේකාකාර අභියෝගයන්ට අපි කනස්සල්ලෙන් නොව ධෛර්යෙන් මුහුණ දුන්නෙමු. දිනපතා දේවවචනය කියවමින් උන්වහන්සේ සමග යාච්ඤාවෙන් කාලය ගතකිරීම හා ඇදහිලිවන්ත සහභාගී කමෙහි අපි ගොඩනැගුණෙමු.

**"මම ලෝකයේ ආලෝකයය, මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය" (යොහාන් 8:12).** හි සඳහන් සත්‍යය මා අත්දැක්කෙමි. දෙවියන්වහන්සේ කසල ගොඩෙහි සිටි මා ඔසවාගත්සේක. මව් කුසේ පටන් මා තොරාගෙන උන්වහන්සේගේ මාර්ගවල ගෙන ගිය සේක. මා උන්වහන්සේට ප්‍රශංසා කරමි. මගේ ජීවිතයේ උන්වහන්සේ මහත් ක්‍රියා කළ සේක. සියළු ගෞරවය මම මගේ ස්වාමින්වහන්සේට පුදකරමි. මම දැන් උන්වහන්සේට නමස්කාර කරන්නියකි. සියළු ගෞරවය මගේ දෙව්පියාණන්ට වේවා!

**- ඉන්ද්‍රානි ගනේෂ් -**

**මොරටුව**

# ස්වාමීවූ යේසුස්වහන්සේ මරණයෙන් නැවත නැගිටුනු පසු කල ප්‍රකාශ දහයක්!

## 01. සහතිකභාවය

**"මගේ සහෝදරයන් ලඟට ගොස් මම මගේ පියාණන්වහන්සේ හා නුඹලාගේ පියාණන්වහන්සේද මාගේ දෙවියන්වහන්සේද හා නුඹලාගේ දෙවියන්වහන්සේද වෙතට නගිමියි ඔවුන්ට කියාපන්නැයි ඈට කීසේක" (යොහාන් 20:17).**

තමන්වහන්සේ මලවුන්ගෙන් නැගිටී බවට හා පියාණන්වහන්සේ වෙතට යන බව සහතික කිරීම, එමෙන්ම මනුෂ්‍යයා සහ දෙවියන්වහන්සේ සමගි කිරීමේ සේවය අවසන් බවද සහතික කරමින් **"මාගේ පියාණන්වහන්සේ නුඹලාගේ ද පියාණන්වහන්සේ ද මාගේ දෙවියන්වහන්සේ නුඹලාගේ ද දෙවියන්වහන්සේ බව ප්‍රකාශ කල සේක"**.

## 02. ශක්තිමත්කිරීම

**"භය නොවෙල්ලා, මාගේ සහෝදරයන් ලඟට ගොස් ගලීලයට පිටත්ව යන්ට ඔවුන්ට කියාපල්ලා එහිදී ඔවුන් මා දකිනවා ඇතැයි කී සේක" (මතෙව් 28:10)**

කලබලයට, භයට හා අවිනිශ්චිතභාවයට පත්ව සිටි තම ගෝලයන් මෙහිදී උන්වහන්සේ ශක්තිමත් කිරීමේ හා ධෛර්‍යයමත් කිරීමේ වචන කතා කරයි. ප්‍රීතිමත් බලාපොරොත්තුවක්ද දෙයි. එනම් ගලීලයෙදී නැවත හමුවෙන බවට. ඒ ලෙස උන්වහන්සේ තම ගෝලයන් එහිදී මුණ ගැසුනි. අදත් උන්වහන්සේ ඕනෑම වේලාවක ඕනෑම තැනකදී අපට මුණගැසිය හැක.

## 03. සාක්ෂිදැරීම

**"උන්වහන්සේ ඔවුන්ට කියනසේක, අඥානයෙනි, අනාගතවක්තෘවරුන් විසින් කියනලද ඒ දේ විඳලාම ස්වකීය මහිමයට පැමිණෙන්නට යුතුව තිබුණා නොවේද කියා, මොසෙස්ගෙන්ද සියලු අනාගතවක්තෘවරුන්ගෙන්ද පටන්ගෙන සියලු ලියවිලිවල තමන් ගැන තිබුණු කාරණා ඔවුන්ට තොරාදුන් සේක" (ලූක් 24:25-27).**

මෙහිදී යේසුස්වහන්සේ තමන්ගැනම සාක්ෂි දරමින් තම අනුගාමිකයන්ට සිදුවූ සියල්ල ඒත්තු ගැනීමට උපකාර කල සේක. එමෙන්ම මුළු දේව වචනය පුරාවටම ජායාවන් මෙන් ලියවී ඇත්තේ යේසුස්වහන්සේ ගැන හා උන්වහන්සේගේ ක්‍රියා පිළිබඳව බව පැහැදිලි කර පෙන්වා දෙයි. උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා මුලු බයිබලයේම තේමාව බවට පත් වී ඇත්තේ යේසුස්වහන්සේය.

## 04. සැක සංකා දුරු කිරීම.

**"උන්වහන්සේ ඔවුන්ට කතාකොට: නුඹලා කැලඹෙන්නේ මක්නිසාද? නුඹලාගේ සිත්වල සංකා හට ගන්නේ මක්නිසාද? මාගේ අත් පා බලා, ඒ මමම බව දැනගනිල්ලා, මා අතගා බලාපල්ලා. මක්නිසාද මස් හා ඇට මට තිබෙනවා නුඹලාට පෙනෙන ලෙස ආත්මයකට නැතැයි කීසේක" (ලූක් 24:38-39).**

මෙහිදී යෙසුස්වහන්සේ තම ගෝලයන් තුල තිබුණාවු සැකය එනම් යේසුස්වහන්සේ ඇත්තටම මළවුන්ගෙන් නැගිට්ටාද? නැතිනම් උන්වහන්සේ ආත්මයක් (හොල්මනක්) ආකාරයට පෙනෙනවද? මෙහිදී යේසුස්වහන්සේ තමන්ගේ ශරීරයේ ඇති තුවාල කැලැල් පෙන්වා තමන් ශරීරාකාරයෙන්ම මරණින් නැවත නැගිටිණු බව ඔප්පු කර පෙන්වීය. අදත් උන්වහන්සේ අපට නොපෙනුනත් ශරීරාකාරයෙන් සෑම තැනම වැඩ සිටින සේක.

## 05. සැලකිල්ල (පුද්ගලික)

**යේසුස්වහන්සේ තෝමස්ට කථාකොට නුඹේ ඇඟිල්ල මෙහි දිගුකොට මාගේ අත් බලාපන්න. නුඹේ අත දිගුකොට මාගේ ඇළයෙහි බහාපන්න. අවිශ්වාස නොකොට විශ්වාසකරපන්නැයි කීසේක (යොහාන් 20:27)**

උන්වහන්සේගේ ගෝලයෙක්, වු තොමස් උන්වහන්සේගේ තුවාල දැක්කොත් පමණක් විශ්වාස කරන බව පවසා තිබුණි, මෙහිදී උන්වහනසේට අවශ්‍ය වුයේ පුද්ගලිකව තෝමස්ට තම ශාරීරික තුවාල පෙන්වා නැවත ඔහු ඇදහිල්ලට පැමිණවීමයි, උන්වහන්සේ අප එකිනෙකා පිලිබඳ පුද්ගලිකවම සැලකිලිමත් වන අතර උන්වහන්සේගේ අවධානය නිරත්තරයෙන් උන්වහන්සේගේ දරුවන් වන අප වෙත යොමුකර ඇත. උන්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයට එකාකාරයි.

## 06. සමාව හා සමාදානය

**"යේසුස්වහන්සේ කථාකොට, දරුවනි නුඹලා ලඟ කන්ට යමක් ඇද්දැයි ඔවුන්ගෙන් ඇසු සේක" (යොහාන් 21:5).**

**"යේසුස්වහන්සේ උත්තර දෙමින්, ඔරුවේ දකුණු පැත්තෙන් දැල දමාපල්ලා, ඒවිට සම්බවේයයි ඔවුන්ට කී සේක" (යොහාන් 21:6).**

**"යේසුස්වහන්සේ කථාකොට, ඇවිත් කන්නැයි ඔවුන්ට කී සේක" (යොහාන් 21:12).**

මේ අවස්ථාව වන විට ගෝලයෝ අධෛර්‍යමත් වී තම ඇදහිල්ල අතහැර දමා තම පැරණි රැකියාවට ගොස් ඇත. යේසුස්වහන්සේ ඉගැන්වු සියළු කරුණුද ඔවුන්ට අමතක වී ඇත. මෙය සැබැවින්ම කණගාටුදායක තත්වයකි. එහෙත් යේසුස්වහන්සේ ඔවුන් වෙත ගමන් කොට සමාව හා සමාදානය ඔවුන්ට ප්‍රධානය කොට නැවත ඔවුන් ස්ථිර කළසේක. නැවත ඇදහිල්ලේ පිහිටුවයි. "ඇවිත් කාපල්ලා" කී විට අමනාපයක් හෝ වරදට පත්කිරීමක් නැති බව උන්වහන්සේ ප්‍රකාශ කරයි. අදත් පාපයට වැටී සිටින අයට අධෛර්‍යමත් වී සිටින අයට අවශ්‍ය කමාව හා සමාදානය උන්වහන්සේ තුල ඇත.

## 07. සැලසුම හා වගකීම

**"යේසුස්වහන්සේ කතාකොට සීමොන් මොවුන්ට වඩා නුඹ මට ප්‍රේමකරනවාදැයි ඇසු සේක. මාගේ බැටළුවන් පෝෂණය කරපන්නැයි කි සේක" (යොහාන් 21:15-18).**

මෙහි යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉදිරි සැලසුම් හා වගකීම් පෙන්වා දෙයි. ඒ සඳහා ඔවුන් ඇතුලාන්තයෙන්ම සූදානම් කරන අතර තම සභාව මේ පොළව මත ගොඩනැගීමේදී කිරීමට තිබෙන ප්‍රධාන වගකීම එනම් ඇදහිලිවන්තයන් පෝෂණය කර රැකබලා ගැනීම තම ගෝලයන්ට පවරයි. අදත් උන්වහන්සේගේ සභාවේ ඇහිලිවන්තයන්ව පෝෂණය කිරීමට හා රැකබලා ගැනීමට සභා නායකයන්ට පවරා ඇත.

## 08. සේවය හා සේවකයෝ.

**"යේසුස්වහන්සේ ඔවුන් ලඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහි ද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියළු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්ම යාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගවන්ව පල්ලා. මමද ලෝකාන්තියම දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක" (මතෙව් 28:18-20).**

සියළු ජාතීන් ගෝලයන් බවට පත්කිරීම, බෞතිස්ම කිරීම හා දේව වචනය ඉගැන්වීම යන තුන්ප්‍රකාර සේවය ඔවුන්ට භාර දුන් අතර ඊට අවශ්‍ය බලය සහිත පොරොන්දුවක් ද උන්වහන්සේ තම ගෝලයන්ට දුන් සේක. එමෙන්ම මෙතෙක් ගෝලයන් වූ ඔවුන් තම සේවකයන් බවට පත්කර ගත්තේය. අද අපට තිබෙන්නේ මෙම මහා අණ වන තුන්ප්‍රකාර සේවය උන්වහන්සේගේ පොරොන්දු ප්‍රකාර ඉටු කිරීමයි.

## 09. සිත් පැහැදවීම.

**"යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්, මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ හිද අනාගතවාක්තෘවරුන්ගේ ලියවිලි වලද ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ විය යුතුයයි, මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේයැයි කීසේක, එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස, ඔවුන්ගේ හිත් පහදවා ඔවුන්ට කියන සේක" (ලූක් 24:44-45).**

යේසුස්වහන්සේ මෙහිදී පරණ ගිවිසුමේ උන්වහන්සේ ගැන ලියා තිබුණු දේ උගන්වා ඒවා තේරුම්ගන්නා පිණිස. තම ගෝලයන්ගේ සිත පැහැදවූසේක. අදද දේව වචනය තේරුම් ගැනීමට නම් දෙවියන්වහන්සේගේ උපකාරය හා ආලේපය අවශ්‍යය. උන්වහන්සේම අපගේ සිත් අලෝකමත් කල යුතුය. අද ඇදහිලිවන්තයන්ගේ ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේය.

## 10. සමුගැනීම.

**"යේසුස්වහන්සේ ඔවුන් බෙතානිය දක්වා කැඳවාගෙන ගොස් තමන්ගේ අත් ඔසවා ඔවුන්ට ආශිර්වාද කළසේක. තවද උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරද්දී ඔවුන් කෙරෙන් වෙන්ව ස්වර්ගයට ඔසවා ගනු ලැබුසේක" (ලූක් 24:50-51).**

අවසාන වශයෙන් මලවුන්ගෙන් නැගිටුණු යේසුස්වහන්සේ තම ගෝලයන්ට ආශිර්වාද කොට ස්වර්ගයට ගිය සේක. මෙම සිදුවීම තම පියවි ඇසින් ගෝලයන් දුටුවේය. අපට අද තිබෙන පණිවුඩය නම් **"නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාග නු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුන්ට කිවෝය" (ක්‍රියා 1:11).**

යේසුස්වහන්සේ නැවත එන සේක.

- ගුරුගරු -



# උතුම් නත්තල

**උඳුවප් මාසේ සීතල දවසක**
**මැදියම් රෑ යාමේ**
**දෙව් මව් තුරුලේ උණුසුම ලබමින්**
**මේ ලෝකෙට ආවේ.........**

ප්‍රිය සහෝදර සහෝදරිය, ඉහත ඇති ගීතිකාව අපට ඇසෙන විට තවත් නත්තලකට අපි ළඟා වී ඇති බව දනිමු. අපි හැමෝම දන්නවා නත්තල් උත්සවය සමරන්නට මුදල් ඇති හැකි අය පමණක්ම නොවෙයි මුදල් නැති බැරි අය පවා යුහුසුලුව සූදානම් වෙනවා. නිවාස අලුත්වැඩියා කිරීමට, අලුත් බඩුමුට්ටු ගැනීමට සහ විවිධ කෑම වර්ග සෑදීමට අධික ලෙස වියදම් දරනවා.

නමුත් කණගාටුවට කාරණය නම් නත්තලේ අර්ථය වැඩි දෙනෙකු තේරුම් නොගැනීමයි. නත්තල කියලා කවුරුත් සිහි කරන්නේ මීට වසර දෙදහසකට පමණ පෙර ගව ලෙනක උපත ලැබූ යේසු බිළිඳුන්ගේ උපත සැමරීමයි. උන්වහන්සේ මේ ලෝකයට ආවේ ඇයි කියලා අපි සොයා බලා උන්වහන්සේගේ සැලැස්ම හා කැමැත්ත අපගේ ජීවිතවල ඉටු කරනවාට වඩා අපි අද කරන්නේ උඳුවප් උත්සවයක් හැටියට යේසුස්වහන්සේව අවුරුදු පතා ගවලෙනක සෙවීමයි.

බොහෝ නිවෙස් වල සහ දේවස්ථාන තුල කුඩා ගවලෙනක් සාදා කුඩා බෝනික්කෙකු ඒ තුල තබා ප්‍රීති වෙන අවස්ථා අපි දැක ඇත්තෙමු. ඇත්තමට යේසුස්වහන්සේ දැන් ගවලෙනේ නැත. උන්වහන්සේ කුරුසියෙහිද නැත. එහෙනම් සොහොන් ගැබේද? ඒත් නැහැ. උන්වහන්සේ අද මහිමවත් සමිඳුන් හැටියට ස්වර්ග යේ දෙව්පියාණන්වහන්සේගේ දකුණු පස වාඩී වී ලෝකයට දෙවෙනිවර ප්‍රකාශවෙන්නට බලා සිටින අතර උන්වහන්සේගේ දරුවන් උදෙසා නිරන්තරයෙන්ම මැදහත්කම් කරන සේක. **"නුඹලා කෙරෙන් ඔසවා ගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි" (ක්‍රියා 1:11)** හි අපට මතක්කර දෙයි.

අපි ඇත්තෙන්ම සූදානම් විය යුත්තේ ඒ දෙවන පැමිණීමේ දී උන්වහන්සේ සමග ස්වර්ගය කරා ගමන් කිරීමටයි. එසේ නැතිව යේසුස්වහන්සේව ගව ලෙනක් සාදා බිළිඳෙකු ලෙස එහි තැබීමට වත්. වරදකරුවෙක් ලෙස කුරුසියේ එල්ලීමටවත්, මළ මිනිසෙකු හැටියට සොහොන් ගැබට දැමීමටවත්, අපි උත්සහ කරනවානම් අපි කරන්නේ ලොකුම ලොකු විහිළුවක්. අප දෙස බලා සිටින අන් අය ඉදිරියේ අප යේසුස්වහන්සේව විහිළුවක් බවට පත් කරයි. අපි සෑම දෙනාම දැනගත යුතු කාරණය නම් අනික් ආගම් කතුවරු මෙන් යේසුස්වහන්සේව මරණයෙන් කෙළවර උනේ නැත. උන්වහන්සේ අදත් අප අතරම ජීවත් වෙයි.

**"ක්‍රිස්තුස්වහන්සේ නො නැගිටුවනු නොලැබූ සේක්නම් අපේ දේශනා කිරීම නිශ්චල බව ශුද්ධ ලියවිල්ල කියයි" (1 කොරින්ති 15:14).**

ඉතින් සහෝදර සහෝදරියනි මේ නත්තලේ සැබෑ අරුත ඔබලාගේ හදවතට ඇතුල් වෙනවා දැකීමයි මගේ පැතුම.

නත්තලේ සැබෑ අර්ථය යනු යේසුස්වහන්සේ ඔබ තුල ඉපදී ඔබ උන්වහන්සේ තුලින් නැවත ඉපදීමයි **"යමෙක් නැවත නුපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වෙන්නට නොහැකිය යයි යේසුස්වහන්සේ කී සේක" (යොහාන් 3:3).**

ඔබ කුමන වයසක සිටියත් ඔබත් මේ ගැන ගැඹුරින් කල්පනා කර බලන්න. ඔබේ හදවත තුල විවිධ ආශාවන් හා බලාපොරොත්තු පිරී තිබිය හැක. ඔබ කෙසේ හෝ ඒවා ඉටු කර ගන්නට උත්සහ දරන්නටත් ඇති, ඒ වගේම ඔබගේ ජීවිතයේ එම බලාපොරොත්තු හා ආශාවන් කඩ වී ගියාම දැනෙන වේදනාවද ඔබ අත් දැක ඇති බව මම විශ්වාස කරමි.

ඔබගේ ජීවිතය යේසුස්වහන්සේට භාර දෙන්න. ඔබේ පාපය හා වරද උදෙසා යේසුස්වහන්සේ කුරුසියක වේදනාව විඳ මරණයට පත් වු බව විශ්වාස කරන්න. ඔබගේ හදවතට උන්වහන්සේට ඇතුල් වන්නට ආරාධනා කරන්න. උන්වහන්සේ ඔබට සමාව දී ඔබට ඔබගේ පාපයෙන් හා වරදින් ගලවන බව අදහන්න. උන්වහන්සේ ඔබගේ ජීවිතය අලුත් කරන බව විශ්වාස කරන්න. **"මා ආවේ ජීවිතය දෙන පිණිසත් එය අධික ලෙස දෙන පිණිසත් යැයි" (යොහාන් 10:10) යේසුස්වහන්සේ කී සේක.**

ඔබගේ ජීවිතය ජයග්‍රාහී ලෙස ගෙන යන්න යේසුස්වහන්සේගෙන් කරුණාව ඉල්ලා ගන්න. ඉතින් මෙවරත් ඔබේ අදහස මේ නතත්ල් කාලයත් උත්සවයක් ලෙසම ගෙවා දමන්නද? මොහොතක් සිතන්න. අරක්කු, සිගරට්, කේක්, රතිඤ්ඤා හා පාටි වලට නත්තලේ සැබෑ හරය හා ප්‍රීතිය ඔබට විඳිය නොහැක. ඔබගේ හදවතේ ඇතුලාන්තය යේසුස්වහන්සේට භාර කරන්න. උන්වහන්සේ ඔබටත් ලෝකයේ සෑම දෙනාටමත් පුද්ගලිකව ආදරය කරන බව අදහන්න.

**"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3:16).**

ඔබත් මේ නත්තලේ ස්වාමි වු යෙසුස්වහන්සේ සමග නතත්ලේ සැබෑ ප්‍රීතිය විඳ ගන්න. ඔබ සැමට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා.

**- ඉරේෂා මෙත්තානන්ද -**

# අනර්ඝ උරුමයක් අපට ඇත

**"මේ වර්තමාන කාලයේ දුක් වනාහි අප කෙරෙහි එළිදරව් කරනු ලබන්නාවූ මහිමයට සමාන කරනු ලබන්ට නොවටියි"**
**(රෝම 8:18)**

ප්‍රේමවන්ත සොයුරු සොයුරිය. ඉහත සඳහන් රෝම පොතේ දේව වචනය ඔබම පෙරළා කියවන්න. එය මතකයෙන් ඔබට කියවිය හැකි නම් එයද ඉතා වටී. ඉහත සඳහන් දේව වචනය ප්‍රකාරයට අප සියල්ලෝම නොයෙකුත් පීඩා මැදින් ගමන් කරමින් සිටිමු. ජාති බේද, යුද්ධය, දරුණු වසංගත, ලෙඩ රෝග සහ නොයෙකුත් විපත්ති තුලින් මිනිස් ජීවිත බොහෝ විනාශ වෙමින් පවතී. මෙම සෑම දේකටම ප්‍රධාන වශයෙන් බලපානු ලබන්නේ, කවුරු විසින් කුමන තර්ක විතර්ක ඉදිරිපත් කලද මිනිසා විසින් සිය මැවුම්කරුට විරුද්ධව ක්‍රියා කිරීම නිසා බව නොකියාම බැරිය. නොයෙකුත් ආකාරයෙන් විශ්වනීය දෙවියන්වහන්සේ මිනිසාට කතාකරමින් සිටියදී මිනිසා ඊට දක්වන්නාවූ ප්‍රතිවිරුද්ධ තත්වය හමුවේ මෙය තවත් සංකීර්ණත්වයට හැරීම සිදුවී ඇත. තවද මිනිසා තුල සිය ආගම ධර්මයන් පිළිබඳව ඇති විශ්වාසය බිඳී තමාටම රිසි වූ නීති මාලාවකට මුරණ්ඩු ලෙස ක්‍රියා කරමින් සිටින බවක් පැහැදිලිව දක්නට ඇත.

වර්තමානයේ මෙම සියළුම ප්‍රශ්ණ හමුවේ කිතුණුවාගේ ඊට දක්වනු ලබන්නාවු ප්‍රතිචාරය කෙබඳුද? බොහෝ කිතුනුවන් මේ මොහොත වන විට අධ්‍යාත්මක අස්ථාවරයට පත්වී ඇති අතර පත්වෙමින් ද සිටිති. එක් පැත්තකින් මෙම සියළුම පීඩා වලින් අපට පෙනී යන්නේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමට කරුණු කාරණා සැකසෙමින් තිබෙන බවය.

මෙම සෑම පීඩා මැද කිතුනුවාගේ ඒ උතුම් අරමුණ නොසෙල්වී තබා ගැන්ම කිතුනුවා සතු වගකීමකි. ඒ පිළිබඳ නියම දැනුමක පිහිටා කටයුතු කිරීමට අප ප්‍රවේශම් වීම බෙහෙවින්ම ඕනෑ කෙරේ. එසේ නොමැතිනම් මෙම පීඩා හමුවේ ඔබද මෙම ප්‍රවාහයට හසුවීමට පුළුවන.

කිතුනුවෙකු යනු ඉතා ආශ්ර්වාද ලත් ස්වර්ගීය පංගුකාරත්වයට උරුම ලද්දෙකි. **(හෙබ්‍රෙව් 3:1)** ඔහුට ඉතා සුවිශේෂී උරුමයක් ඇත්තෙකි, මෙහි අගය, වටිනාකම දන්නෙකු එම උරුමය ඉතා ප්‍රවේශමෙන් ආරක්ෂා කරයි. කොයිම බාධාවක් හමුවෙ හි එම උරුමයට හානියක් නොපැමිණෙන ලෙස වග බලා ගැනීම ඔහු සතු ක්‍රියාවකි. දාවිත් රජු වරෙක ඉතා තද අමාරුවකට පත් වූ මොහොතක ඔහු සතුව තිබූ එකම ශක්තිය වූයේ තමන් අදහන්නා වූ බලවත් දෙවිඳුන්ගේ කරුණාවයි. අප හොඳින් දන්නාවු දාවිත් රජු

උන්වහන්සේ තුල ශක්තිය උපදවා ගත් බව ඇතුලු සම්පූර්ණ සිදුවීම ඔබට (**1 සාමුවෙල් 30:6**) කියවා ගත හැක. අප කුමන පසුබිමක ගමන් කෙරුවාද කුමන අභියෝග තුල ගමන් කෙරුවාද අපට ඉන් ජය දෙන්නේ අපේ දෙවියන්වහන්සේ බව දන්නෝ ඉතාමත් ස්වල්ප දෙනෙකු බව ඇතැම් සිදුවීම් වලින් පෙනී ගොස් තිබේ. සැබවින්ම එම ස්වල්ප දෙනා **එළිදරව් 3:5** හි කියනු ලබන ජය ගන්නෝ බවට පත් වෙති.

දේව වචනය අපට මෙසේ අවවාද කරනු ලබයි. "**එසේ වී නමුත් නුඹලාට ඇතිදේ මා එන තුරු තදින් අල්ලා ගෙන සිටින්න**" (**එළිදරව් 2:25**). මීට උදාහරණයක් වශයෙන් බලන්න. දිනක් ඇමෙරිකාවේ ගොවිපෙලක බැටළු පැටවෙකු රාජාලියෙකු විසින් රැගෙන ගොස් ඇත්තේ එහි පාලකවරයා ඉදිරියේදීමය. කලබලයට පත් එහි පාලකවරයා නොයෙකුත් උපක්‍රම භාවිතා කරමින් හිස් අවකාශයට වෙඩි තබා රාජාලියාව බිය ගෙන්වා අසරණ බැටළු පැටවාව රාජාලි ග්‍රහණයෙන් බේරා ගැනීමට තැත් දැරූ මුත් එම උත්සහය නිරර්ථක වුනි. අවසානයේ එම රාජාලියා සිය ශක්තිමත් නිය වලින් ඩැහැගත් ගොදුර සමග කඳු මුඳුන් මතින් නොපෙනී ගියේ තම අල්ලා ගත් වටිනා ගොදුරු කිසිදු ආකාරයකින් බාධා හමුවේ අතහැර තමන්නට කිසිසේතම සූදානම් නොමැති බව බැටළු පාලකයාට පසක් කර දෙමිනි. අසරණ බැටළු පැටවාගේ ජීවිතය පිළිබඳ අප කණගාටු වූ නමුත් රාජාලියා ඉන් අපට දෙන පණිවිඩය සුළුපටු නැත. ඔබ බාධා හමුවෙහි ඔබේ වටිනා හා අනර්ඝ උරුමය අතහැර දමන්නෙකුද? "**ඉක්මතින් එම් කිසිවෙක් නුඹේ ඔටුන්න නොගන්නා ලෙස නුඹට තිබේන දේ අල්ලා ගන්න**" (**එළිදරව් 3:11**).

කිතුනුවෙකුට තිබෙන මෙම අනර්ඝ ඔටුන්න අහිමි කරගෙන කුමන දෙයක් අල්ලා ගත්තද ඉන් පලක් නොමැති අතර සැබවින්ම ඔහු පරාජිත කිතුනුවෙකු බවට යක්ෂයා විසින් ඇද දමනු ලබති. "**මක්නිසාද යම් මනුෂ්‍යයෙකු මුළු ලෝකය ලබා ගත්තත් තමාගේ ජීවිතය නැතිවී ගියහොත් ඔහුට ඇති ප්‍රයෝජනය මොකක්ද?**" (**මාර්ක් 8:36**).

"**ඔහු ඔවුන්ගේ රජුගේ ඔටුන්න ඔහුගේ හිසෙන් ගත්තේය**" (**1 සාමුවෙල් 12:30**). ප්‍රේමවන්ත සොයුරු සොයුරිය මෙලෙස තම ඔටුන්න අහිමි කරගත් පරාජිතයෙකු නොවන්න. ශුද්ධ වූ පාවුල් තුමන් බොහෝ පීඩා විඳී බව **2 කොරින්ති 11:24** පෙන්වා දෙයි. දෙවියන්වහන්සේ පීඩා තුළදී ඔබ වෙනුවෙන් ඉදිරිපත් වන බව දේව වචනය පෙන්වා දෙයි. (**දානියෙල් 3:25 ,ක්‍රියා 7:56**) ප්‍රශ්ණ හමුවේ ශක්තිමත් වන්න. සාර්ථක කිතුනුවෙකු බිහිවෙන්නේ පීඩා මැද ජය ගැනීම තුළිණි (**ක්‍රියා 14:22**).


ශද්‍රක්, මෙශක්, අබෙද්-නෙගෝ මෙන් පීඩා මැදදී සිය ඇදහිල්ලේ ස්ථාවරය ප්‍රකට කිරීම නොසෙල්වන කිතුනුවෙකුගේ නියම ස්වභාවය වේ. (**රෝම 8:35**) දෙවිඳුන් තුළ ශක්තිමත් වී තමා ලබාගත් ඒ උතුම් ගැලවීමේ උරුමය තදින් අල්ලා ගන්න. එය ඔබව සදාකාල ජීවිතයට පමුණුවනු ඇත. "**මරණය දක්වා විශ්වාසව සිටින්න. ඒවිට මෙම ජීවනයේ ඔටුන්න නුඹට දෙන්නෙමි**" (**එළිදරව් 2:10**).

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

# දෙවියන්වහන්සේ කෙරෙහි භය වීමෙන් මනුෂ්‍යයාට ලැබෙන ආශිර්වාද

භය යන වචනය මනුෂ්‍යයන් ඇසීමට පවා අකමැති වචනයකි. අද ලෝකය දෙස බැලුවහොත් සෑම මනුෂ්‍යයෙකුගේ ම හදවත් වල භය රජවෙමින් පවතිනවා. ලෝකයේ සෑම රටකම යුද්ධය පවතිනවා. ඊට එකම හේතුව භයයි. මනුෂ්‍යයා තම රට, ජාතිය, නිලතල නැතිවේයැයි කියා භයවෙනවා. ඒ නිසා ඔවුන් යුද්ධ කරනවා. ඔවුන් මිනි මැරීමට පවා පෙළඹෙනවා. අපට මේ භය වර්ග කොට කොටස් කිහිපයකට බෙදිය හැකිය. මනුෂ්‍යන්ට ඇති භය, මරණයට භය, හොල්මන් අවතාර වලට භය, කළුවරට භය, අනාගතය ගැන භය යනාදී වශයෙන් කොටස් කළ හැකිය. බයිබලයේ **ගීතාවලිය පොතේ 56:3** හි මෙසේ සඳහන් වෙනවා **"මට භය ඇති කල්හි මම ඔබ කෙරෙහි (දෙවියන්වහන්සේ) විශ්වාස කරන්නෙමි"** මේ වචන පැවසුවේ දාවිත් විසිනි. භය හේතුකොට ගෙන සමහරු ඉක්මන් තීරණයට පැමිණෙනවා. මනුෂ්‍යයන් බොහෝ වැරදි දේවල් වලට පෙළඹෙන්නේ මේ භය හේතු කොට ගෙනය.

නමුත් අපි බලන්න යන්නේ මනුෂ්‍යයන් සිතනවාට වඩා හාත්පසින්ම වෙනස් භයක් පිළිබඳවයි. එය ගෞරවනීය හා ප්‍රේමණීය භයක්. ඒ තමයි දෙවියන්වහන්සේ කෙරෙහි ඇති භය කෙටියෙන් කියතොත් "දේව වචනය කඩ කිරීමට ඇති භයයි." හිතෝපදේශ පොතේ දෙවියන්වහන්සේ කෙරෙහි භය වීමෙන් මනුෂ්‍යාට ලැබෙන ආශිර්වාද 8ක් ගැන සඳහන් වී තිබෙනවා. ඒ පිළිබඳව කෙටියෙන් අපි බලමු.



01. දැනගැනීම හා ප්‍රඥාව ලැබීම.
**(හිතෝපදේශ 1:7 සහ 9:10)**
ඔබට ප්‍රඥාව අඩුද? එනම් දෙවියන්වහන්සේ කෙරෙහි දේවභය

සහිතව ජීවත්වන්න (**යාකොබ් 1:5**) හි කියා තිබෙනවා යමෙකුට ප්‍රඥාව අඩුනම් ඉල්ලන්න කියා ඒවිට දෙවියන්වහන්සේ ඔහුට ප්‍රඥාව දෙනවා ඇත.

02. නහරවලට සනීපයද නුබේ ඇටවලට ප්‍රාණවත්කමද ලැබේ. නොහොත් නීරෝගී ජීවිතය. (**හිතෝපදේශ 3:8**)

03. නපුරට ද්වේෂ කිරීමට හැකියාව ලැබේ. (**හිතෝපදේශ 8:13**).

04. දීර්ඝායුෂ ලැබේ. (**හිතෝපදේශ 10:27**).

5. බලවත් නිසැකකමක් හා ආරක්ෂාවක් ලැබේ. (**හිතෝපදේශ 14:26**).

6. මරණීය උගුල්වලින් ගැලවීම (**හිතෝපදේශ 14:27**).

7. වස්තුවත්, ගෞරවයත් හා යහපත් ජීවිතයක් ලැබේ. (**හිතෝපදේශ 22:4**).

8. දෙවියන්වහන්සේගේ හා මනුෂ්‍යයන්ගේ ප්‍රශංසාව ලැබේ. (**හිතෝපදේශ 31:30**).

අද කිතුණු ඇදහිලිවන්තයන් පවා ජීවත්වන්නේ ක්‍රියාකරන්නේ තමන් තුල දෙවියන්වහන්සේට කිසි භයක් නැති ආකාරයටයි. ඔහු දෙවියන්වහන්සේ කෙරෙහි ඇති භය සුළු කොට සිතති. අපේ දෙවියන්වහන්සේ ශුද්ධවූ දෙවියන්වහන්සේය. එදා මෝසෙස් හට දසපනත දෙවියන්වහන්සේ දෙන විට සෙනග භයින් හා වෙව්ලමින් දුරින් සිට දෙවියන්වහන්සේ අප සමග කථා නොකරන සේකවා! මොසෙස් පමණක් අපට කථා කළ මැනවයි කීවාය. ඔවුන් දෙවියන්වහන්සේට එපමණ භයකින් යුක්තව සිටි බව පෙනීයනවා එය (**නික්මයාම 20:18-20**) දක්වා තිබේ. ඒදා හිටපු දෙවියන්වහන්සේ අදත් අප සමග සිටිනවා. ඔබ ඇදහිලිවන්තයෙක්ද? එනම් දෙවියන්වහන්සේ කෙරෙහි එම ප්‍රේමණීය, ගෞරවනීය භය ඔබ තුල තිබේනවාද කියා ඔබ ඔබේ සිතට තට්ටුකර බලන්න. දේවභය සහිත ශුද්ධ වූ ජීවිතය ගත කිරීමට ඔබ හා මා කැඳවා ඇත.

**- ජීවන හඬ -**

# දේව වචනය සහ ඔබ



ප්‍රිය මිතුර මිතුරියනි, දේව වචනය තුලින් දෙවියන්වහන්සේ සපයා ඇති අධික ප්‍රඥාව සහ ආශිර්වාදය සෑම කිතුනුවකුටම ලබාගත හැකිය. කිතුනුවකුගේ වර්ධනය සඳහා මූලික ආහාරය දේවවචනයයි. අප පෞද්ගලිකව බයිබලය කියවීමෙහි සහ අධ්‍යයනයෙහි යෙදෙනවිට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට දේව වචනය උගන්වන සේක. කිතුනුවා බයිබලය කියවීමට අධ්‍යයනය කිරීමට පෙළඹෙන විට දෙවියන්වහන්සේ මේ අතිමහත් ප්‍රඥාව තුල සැඟව ඇති රහස් ඔබට විවෘත කරනසේක. ඔබ දේවවචනය මෙනෙහි කිරීම සහ යාච්ඤාව මගින් එම අදහස් තේරුම් ගැනීමටත් ඔබේ ජීවිතයට එය අදාල කර ගැනීමටත් උත්සුක විය යුතුය "**<u>නුඹේ දියුණුවීම සියල්ලන්ට පෙනෙන පිණිස ඒ දේවල් කඩිසර ලෙස භාවිත කරමින් (මෙනෙහි කරමින්) එහිම යෙදී සිටින්න"</u>**
**<u>1 තිමෝති 4:15).</u>**

මගේ ප්‍රිය මිතුර මිතුරියනි, බයිබලය ජීවනදායක ග්‍රන්ථයකි. සත්‍යයෙන් පිරි සම්පතකි. එය "**ආත්මය ප්‍රණවත් කරන්නේය නුවණ නැත්තන් නැණවත් කරන්නේය, සිත ප්‍රීති කරවන්නේය, ඇස් එළිය කරන්නේය, අනර්ඝ ස්වර්ණ රාශියකටත් වඩා එයට ආශාවිය යුතුය, එය මීපැණිවලටත් වඩා මිහිරිය, ඒවා පැවැත්වීමෙන් මහත් විපාක ඇත්තේය" ගීතාවලිය 19:7-11** දක්වා සඳහන් කර තිබේ. දේව වචනය හරි ආකාරව ග්‍රහණය කර ගැනීමට ඇති මාර්ග නම් කටපාඩම් කිරීම, කියවීම, අධ්‍යයනය කිරීම සහ දේව වචනය දේශනාකරන විට සහ උගන්වන විට එයට සවන් දීමයි. නමුත් දේව වචනය දැන ගැන්මම පමණක් ආත්මික වර්ධනය සහතික නොකරයි. ඔබේ මනසේ රැඳුන දේවවචනය ඔබේ හදවත තුලට කිඳා බැස ඔබගේ දිනපතා ජීවිතය වෙනස් කළ යුතුය. දාවිත් රජතුමා පැවසු පරිදි දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේගේ වචනය දැනගෙන එය මෙනෙහි කර ඔබගේ ජීවිතය ගැන සලකා බලා අවශ්‍ය වෙනස්කම් ඇතිකර ගැනීමයි.

**"මාගේ මාර්ග කල්පනාකොට ඔබගේ ශික්ෂා වලට මාගේ පාද හරවා ගිතිමි" (ගීතාවලිය 119:59).**

ඔබගේ පාද හරවා ගැනීම නොහොත් දේවවචනයට කීකරුවීම අපගේ ආත්මික වර්ධනයට අත්‍යාවශ්‍යයි. ඔබගේ ජීවිතය දේවවචනය ඉගෙනීම සමග සසඳා බලා, ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීමට කීකරුවන කල දේව කැමැත්ත සහ මාර්ග අත්දැකීමෙන් සහ බුද්ධියෙන් දැනගන්නවා ඇත. එවිට ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ පරිනත වෙයි.

ක්‍රිස්තුස්වහන්සේ විසින් ඔබව වෙනස් කරනු ලැබීමට පෙර ඔබගේ ජීවිතය කෙසේවීද? ඔබගේ අලුත් ජීවිතය සමග සංසන්දනය කරනවිට අපගේ පරණ ජීවිතය අඳුරෙන් සහ රහසිභාවයෙන් පිරී තිබුණු බව අලුත් ගිවිසුම අපට ස්ථිරව මතක් කර දෙයි. **"නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත්කල සේක. පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුල දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත් ඒවායේ හැසුරුණාහුය. ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංශයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත්, හිතටත් කැමති දේ කරමින් ස්වභාවයෙන් අනික් අය මෙන් උදහසේ දරුවෝව සිටියෙමුව" (ඒපීස 2:1-3).** කිතුණු ජීවිතය පටන් ගන්නේ ප්‍රතිසංස්කරණයකින් නොව නමුත් විපර්යාසයකින්ය. අප අමුතුවෙන් පටන් ගැනීමක් නොව නමුත් දෙවියන්වහන්සේ අපට සම්පූර්ණයෙන්ම අලුත් ජීවිතයක්



දීමෙන්ය. උන්වහන්සේගේ ජීවිතය අපට ප්‍රදානය කිරීමෙන්ය. යම් කෙනෙකු "ක්‍රිස්තුස්වහන්සේ තුල" සිටින විට (ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගත්විට) ඔහු අලුත්මැවිල්ලක් ලෙස හඳුන්වයි. **"එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17).**

"ඔබගේ ජීවිතය තුල දෙවියන් වහන්සේගේ වචනය" යන්න මීලග කලාපයෙන් සවිස්තරාත්මකව ගෙන එන්නෙමු. එතෙක් මෙම හැඳින්වීම තුළ ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේ සහ දේවවචනය යන්න පිළිබඳව මනා සමීක්ෂණයක යෙදෙන ලෙස ඔබට ආරාධනා කරමු.

**- බයිබල් අධ්‍යනයක් ඇසුරෙන් -**

# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී උන්වහන්සේගේ මහිමය

**(එළිදරව් 19:11-16).**

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තේජෝ මහිමය සියැසින් දැක ගැනීමට මිනිස් සංහතියට අවස්ථාව උදා වන්නේ උන්වහන්සේගේ දෙවන පැමිණීමේ අවස්ථාවේදීය. එනම් මිහිපිට රජකම් කිරීම පිණිස පොළොවට පැමිණෙන අවස්ථාවේදීය. එයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීම යයි කියනු ලැබේ. ඇත්තෙන්ම එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමේ දෙවන කොටස වේ. උන්වහන්සේගේ දෙවන පැමිණීමේ පළමු වන කොටස නම් තම ඇදහිලිවතුන් ස්වර්ගයට ගෙන යෑම පිණිස වළාකුල් මතට පැමිණීමයි. එය රහසිගතව සිදුවන්නකි. එවිට යේසුස්වහන්සේව දකින්නේ වළාකුල්වලින් අහසට ඇදගනු ලබන ඇදහිලිවතුන් පමණි ඒ පීඩා කාලය ආරම්භ වීමට පෙරදීය. එහෙත් උන්වහන්සේගේ එළිදරව් වීම සියලු ලෝකවාසී ජනතාව දකිනු ඇත. **"බලාපල්ලා උන්වහන්සේ වළාකුල්වලින් එනසේක. සියලු ඇස්ද උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේව දකින්නෝය" (එළිදරව් 1:7).**

ස්වාමීවූ යේසුස්වහන්සේගේ එළිදරව් වීමෙහි මහිමය පිළිබඳව ඉතා කෙටි සඳහනක් **එළිදරව් 19:11-16** දක්වා ඇති දේව වචන කොටසෙහි සඳහන්ව තිබේ. එය කියා නිම කල නොහැකි මහිමයක් වන නමුදු එම දේව වචන කොටසෙහි උන්වහන්සේ හඳුන්වන විවිධ නාම මගින් ඉතා සුලු පමණින් හෝ ඒ මහිමය අපට හඳුනාගත හැකි වෙයි.

## ක්‍රිස්තුස්වහන්සේ එළිදරව් වීමේදී උන්වහන්සේ හැඳින්වෙන නාම.

1. විශ්වාසය නම් වූ තැනැන්වහන්සේ - (**එළිදරව් 19:11**).
2. සැබෑව නම් වූ තැනැන්වහන්සේ - (**එළිදරව් 19:11**).
3. කිසිවෙකු නොදන්නාවූ නමක් ඇත්තාවූ තැනැන්වහන්සේ - (**එළිදරව් 19:12**).
4. දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝ යයි නම් ලැබූ තැනැන්වහන්සේ - (**එළිදරව් 19:13**).
5. රජවරුන්ගේ රජය, ස්වාමිවරුන්ගේ ස්වාමීන්වහන්සේ යයි නම් ලැබූ තැනැන්වහන්සේ - (**එළිදරව් 19:16**).

ඉහත මෙම නාම එකිනෙක මගින් උන්වහන්සේගේ මහිමයේ විවිධ පැතිකඩ එළිදරව් කරයි. එයට ලෝකවාසී ජනතාවගේ ප්‍රතිචාරය **පිලිප්පි 2:9-11** දක්වා සඳහන් කොට තිබේ. **"එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කලේ, පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත් ය".**

**"යේසුස්වහන්සේගේ මහිමය"**
**- පොතෙන් උපුටාගන්නා ලදී -**
**කතා - නෙවිල් ජයසුන්දර**

"මම ඉක්මණින් එමියි, යේසුස්වහන්සේ කීසේක" (එළිදරව් 22:20)

# සහෝදර, සහෝදරියනී, මිතුරු මිතුරියනී,
# ලැබුවාවූ **2022** නව වසර

ඔබ සැමට

සාමය, සතුට, නිරෝගී සුවය හා සෞභාග්‍යමත්

දේව කරුණාව හා ආශිර්වාදය පිරි

නව වසරක් වේවා !

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo

## ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය

අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com

ස්වාමී වූ යේසුස්වහන්ස, වැඩිය මැනව ! (එළිදරව් 22 : 21)

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com